ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 26/10/21

පැමිණිලි පාර්ශවය : ජයමිණි ප්‍රියලාල් හින්ඩිල් මයා,
පොලිසිය අසල,
මාවතගම.

වගඋත්තරකාර පාර්ශවය : 01. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
මාවතගම.

02. උ.පො.ප රාජපක්ෂ මයා,
විවිධ පැමිණිලි අංශය,
පොලිස් ස්ථානය,
මාවතගම.

පැමිණිලි අංකය : **HRC/1958/16**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා සහ තවත් පුද්ගලයෙකු අතර ඇති වූ බහින් බස්වීමක් සම්බන්ධයෙන් තමාට එරෙහිව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් විභාග කිරීම සඳහා පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට කරන ලද දැනුම්දීමට අනුව තමා 2016.03.28 වන දින උදෑසන 9.00 ට පමණ පොලිස් ස්ථානයට ගිය විට තමාව අත්අඩංගුවට ගෙන පසුදින 9.00 ට අධිකරණයට ඉදිරිපත් කළ බවත්, ඒ අනුව සමථ කළහැකි සිදුවීමකට පැය 24 ක් යාමට ප්‍රථම අධිකරණයට ඉදිරිපත් කිරීමේ හැකියාව තිබියදීත් තමාව පොලිස් ස්ථානයේ රඳවා තබාගැනීමට කටයුතු කිරීමෙන් තමා ආර්ථික මෙන්ම මානසිකවද අපහසුතාවයකට පත්වූ බවට පැමිණිල්ලෙන් දක්වා ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office : 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone : 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson : 011-2505451
ලේකම් / செயலாளர் / Secretary : 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax : 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline : 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail : sechrc@gmail.com
වෙබ් / இணையம் / Web : www.hrcsl.lk

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, 2016.03.25 වන දින පරුෂ වචනයෙන් බැණවැදී මරණ බවට තර්ජණය කිරීමක් සම්බන්ධව මෙම පැමිණිලිකරුට එරෙහි පැමිණිල්ලක් වාර්තා වී ඇති බවත්, එම පැමිණිල්ලට අනුව මෙම පැමිණිලිකරුට වරද කියා දී 2016.03.28 වන දින දෙවන වගඋත්තරකරු විසින් අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කිරීමෙන් පසු අධිකරණයට ඉදිරිපත් කළ බවත්, පසුව අධිකරණය මඟින් දෙපාර්ශවය සමථ මණ්ඩලයට යොමු කරන ලද බවත්, එහිදී සමථ නොවීම මත නැවත අධිකරණයට යොමු කිරීමෙන් පසුව අධිකරණයේදී දෙපාර්ශවය සමථයකට පත්වීම මත පැමිණිලිකරුට අවවාද කර මුදා හැර ඇති බවත්ය.

මෙම සැකකරු අත්අඩංගුවට ගෙන ඇප මත මුදා හැරියද සාමය කඩවීමක් සිදුවිය හැකි බවට කරුණු අනාවරණය වීම මත අධිකරණයට ඉදිරිපත් කරන ලද බවත්, 2012 වර්ෂයේදීද මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම සම්බන්ධයෙන් මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර, දැනට ඔහු නිදහස් කර ඇති බවත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරු මූලිකවම කොමිෂන් සභාව හමුවේ දක්වා ඇත්තේ, සාධාරණ නොවන හේතුවකට අත්අඩංගුවට ගෙන නීති විරෝධී ලෙස අනවශ්‍ය කාලයක් රඳවා තබා ගැනීම තුළින් තමාට මානසික මෙන්ම ආර්ථික වශයෙන්ද බලපෑමක් ඇති වූ බවයි.

එහිදී පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ, 2016.03.25 දින ප.ව 6.30 ට ලද 'පිහියක් බෙල්ලට තබා මරණ තර්ජණය කිරීම' පිළිබඳ ලද CIB II 292/423 දරණ පැමිණිල්ලට බව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකරු 2016.03.28 දින අත්අඩංගුවට ගෙන පසුදින දක්වා රඳවා තබාගැනීමෙන් පසු අධිකරණයට ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය වේ.

මෙහිදී පැමිණිල්ල ලද පසු පොලිස් නිලධාරීන් විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් සිදුකර ඇති බවක් ලේඛන අනුව නිරීක්ෂණය නොවන අතර, ලද පැමිණිල්ල මතම පමණක් අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

1977 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32 (ආ) හි දක්වා ඇත්තේ, සාධාරණ පැමිණිල්ලකට, ඔත්තුවකට, සැකයකට යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමේ හැකියාව ඇති බවයි. නමුත් මෙහිදී මෙම ලද පැමිණිල්ල සාධාරණ පැමිණිල්ලක්ද යන්න තහවුරු කරගැනීමට වගඋත්තර පාර්ශවය කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ.

මෙහිදී <u>කපුගීකියනගේ එදිරිව හෙට්ටිආරච්චි සහ වෙනත් අය</u> නඩුවේදී දක්වා ඇති කරුණු වන අත්අඩංගුවට ගැනීමේදී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ සඳහන් නීති මඟින් ස්ථාපිත කරන ලද ක්‍රියා පටිපාටිය හැර වෙනත් ක්‍රියාවක් අදහස් කළ නොහැක යන්න තහවුරු වේ.

තවද, මෙම පැමිණිල්ලේ ස්වභාවය අනුව සමථ මණ්ඩල පනතේ උපලේඛන 2 යටතේ සමථ මණ්ඩලයට යොමු කිරීමේ හැකියාව තිබියදී අධිකරණයට යොමුකර ඇති බවද අධිකරණය වෙත යොමු කිරීමෙන් අනතුරුව මෙය සමථ මණ්ඩලය වෙත යොමුකර ඇති බවද තවදුරටත් නිරීක්ෂණය වේ.

<u>නවාසිවසම් එරෙහිව ගුණවර්ධන</u> නඩුවේදී ඉහත තත්වයට සමාන කරුණු සාකච්ඡා කර ඇත. එසේම අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 37 වන වගන්තියේ දක්වා ඇත්තේද පැය 24 ක කාලය තුළදී අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බවයි.

නමුත්, අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශනයක් නොතිබියදී පැය 24 ක කාලයක් මෙම පැමිණිලිකරුව රඳවා තබාගෙන ඇති බව නිරීක්ෂණය වේ. එමඟින් මෙම පැමිණිලිකරුට තම දරුවන් සඳහා ලබාදිය යුතු ආරක්ෂාව ලබා දීමට නොහැකි තත්වයකට පත්ව ඇති බවද නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

ඒ අනුව වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය තුළින් මෙම පැමිණිලිකරුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාව හා 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට ආරක්ෂා කර දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකරුට රු. 10,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතුය.

02. තවද වගඋත්තර පාර්ශවයේ මෙකී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා සහ මෙම නිර්දේශය අදාළ වකවානුව තුළ මාවතගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත සහ දෙවන වගඋත්තරකරුගේ වර්තමාන සේවා ස්ථානය වෙත යොමු කිරීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති සහ අධ්‍යක්ෂ (නීති), පොලිස් නීති කොට්ඨාශය වෙතද යොමු කරනු ලැබේ.

2021.11.26 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmugana...

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 01.
02. අධ්‍යක්ෂ (නීති), පොලිස් නීති කොට්ඨාශය, පොලිස් මූලස්ථානය, කොළඹ 01.
} ඉහත 02 නිර්දේශය අනුව කටයුතු කිරීමට

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.

B/